# අලියාට කතිරය ගැසීම

කිසි දිනක එජාපයේ හිතවතකු නොවූ මම එක ම වතාවක් අලියාට කතිරය ගැසුවෙමි. එය දිග කතන්දරයකි.

1947 මැතිවරණයේදී ඡන්ද බලය ද නොමැතිව සමසමාජ අපේක්ෂකයාට වැඩ කළ මට පනස් දෙකේ හොරණ ආසනයට පක්ෂයෙන් තරඟ කළ විල්ෆ්‍රඩ් සේනානායක වෙනුවෙන් රැස්වීමක කතා කරන්නට අවස්ථාවක් එළඹුණේ මා නො දැනුවත්වම ය. මගේ නම ප්‍රචාරක දැන්වීමකට ඇතුළත් කළ සංවිධායකවරයෝ මා ගමට නොඑතැයි සිතා එය ඉවත් කළහ. මම ද එය නිදහසට කරුණක් ලෙසින් ගෙන නිහඬ වූයෙමි. ඉන් පසු හැටේ මැතිවරණ දෙක ගැන මා දැක්වූ උනන්දුව හුදෙක් රැස්වීම් බලන්නට යාමට සීමා වූයේ ය. පනස් දෙකෙන් පසු හොරණ ආසනයේ දේශපාලන වැඩකට සම්බන්ධ වීමට මට වුවමනාවක් හෝ අවස්ථාවක් ද නො වීය.

එවක අපේ ගම් පෙදෙසේ දේශපාලනය කෙරෙහි සිය ආධිපත්‍යය පතුරුවමින් සිටියේ උඩුගහපත්තු ගම් කාර්ය සභාවේ සභාපති එඩ්මන්ඩ් අමරසේකර මහතා ය. නිතරඟයෙන් ම අපේ ගමේ නියෝජිතයා වශයෙන් පත්වුණ ඔහු ගම් පළාතේ සියල්ලන් ම හැඳින්වූයේ පුංචි මහත්තයා නමිනි. අසරද්ධේතරාරාසවේ ඉරිදා දහම් පාසලේ අප සහභාගි වූ ඉංගිරිසි පන්තියෙන් ඇරැඹුණු ඔහුගේ සමාජ සේවය ගම් සභාව පුරා පැතිරෙන්නට වැඩි කලක් ගතවූයේ නැත. පළාතේ එජාපය නියෝජනය කරන බලවතා වූ ඔහුට අභියෝග කරන්නට ද කිසිවෙක් නොවූහ.

ඔහුගේ අනභිභවනීය බල පරාක්‍රමය මා පළමු කොටම දුටුවේ හාන්දුපැල්පොල ගම්සභා නියෝජිතකමට තරඟයක් ඇති වූ විට ය. මම එවක පාසලේ ශිෂ්‍යයෙක් වීමි. ඡන්ද මධ්‍යස්ථානය අපේ පාසලමය. අපි පාසැල් ගේට්ටුව අබියස වූ තේ කඩයට වී ඡන්දය දැමීමට මුල පුරන සැටි බලා උන්නෙමු. ඒ වන තෙක් නිතරඟයෙන් ම තේරී පත් වූ පොඩි මහත්තයා (ආරච්චි ආතාගේ පුතා) සමඟ තරඟයට ඉදිරිපත් වූයේ වාමාංශිකයෙකැයි සිතමි. ඡන්දය දැමීම පටන් ගන්නවාත් සමඟ ගේට්ටුව වෙත ආ පුංචි මහත්තයා ඡන්දදායකයකු පාසැල දෙසට යැව්වේ අහළ පහළ සිටි සියලු දෙනාට ම ඇසෙන පරිදි මෙබඳු ප්‍රකාශයක් ද කරමිනි.

''ඔන්න, හේරත් මුදියන්සේලාගේ ආරියරත්නගේ ඡන්දෙ ෟ''

ඒ මනුස්සයා ඇතුළට ගොස් ඡන්දය දමා නිරුපද්‍රිතව ආපසු ආවේ ය. හඬ නඟා කී නම අනෙක් අපේක්ෂකයාගේ ය. ඔහුගේ ඡන්දය හොරෙන් දමන්නට කෙනකු තමන් පිටත් කර යවන බව ය, පුංචි මහත්තයා කීවේ. ඒ ගියේ ආරියරත්න නොවන බව අපි කවුරුත් දනිමු. එරෙහි වන්නට කෙනෙක් නැත.

හොර ඡන්ද දැමීම බහුල ව සිදුවූ නමුත් මේ විදියේ ඡන්දය දැමීමක් කිසි දිනක මා නම් දැක නැත. මෙසේ පළාතේ ම සිය අණසක පතුරුවමින් සිටි එඩ්මන්ඩ් අමරසේකර මහතා සමඟ හරි අල්ලන්නට සිතුවේ සරසවි අධ්‍යාපනය හමාර කොට පැමිණි අල්ලපු ගමේ, මිල්ලෑවේ බී.ඩී. මුනිදාස ය. බල තරඟයේ පළමු පියවර වූයේ අසකු ගෙනවුත් උෟ පිට නැඟී මග තොට ගමන් කිරීම ය. ආරංචියෙන් පමණක් දැන ගත් මෙම ජවනිකාව සටනකට පෙරහුරුවක් බව සිතා ගත්තේ පුංචි මහත්තයා වසර ගණනාවකට පෙර අසු පිටින් තමාගේ වතු පිටි බලන්නට යනවා මා දැක තිබූ හෙයිනි. අශ්වාරෝක මුනිදාස (වික්‍රමනායක) වීදි සංචාරයේ නිරත වූ අවදියේ එඩ්මන්ඩ් අමරසේකරට අසකු තබා ඉස්තාලයක්වත් නො තිබුණේ ය. ගම්වැසියන්ට මෙම ප්‍රභූ සංකේතය මතක තිබුණාට සැකයක් නැත. වරක් අසු පිටින් යද්දී බුනිදාස පාරේ වැටුණු බව ද අසන්නට ලැබුණේ ය.

නවසිය හැත්තෑ හයේ ජනතා ජයග්‍රහණය සමඟ හොරණට කිසිම සම්බන්ධයක් නොමැති සාගර පලන්සූරිය පහසුවෙන් ම හොරණ මන්ත්‍රීවරයා වශයෙන් පත්විය. ඒ වන විට මුනිදාසට ගමේ පමණක් නොව පළාතේ ම සෑහෙන බලයක්, පිළිගැනීමක් තිබුණු බවත්, පලන්සූරියගේ ජයග්‍රහණය උදෙසා ඔහු වෙහෙසුණු බවත් දනිමි. ඔහු ඉදිරිපත් වූයේ නම් පලන්සූරියට ද වඩා බහුතර ඡන්දයකින් ජයගන්නට හැකි බව පළාතේ හැමදෙනාම දැන සිටියහ. එබඳු වාසිදායක මැතිවරණයක් තිබියදීත් තමාම ඉදිරිපත් නොවී 'පැරෂුට් කාරයකු' (පිටින් ඇවිත් පාත් වන අපේක්ෂකයන් හැඳින්වූයේ එසේය) පෙරමුණට ගන්නට මුනිදාස තීරණය කළේ ඇයි ද යන්න අදත් මට අබිරහසකි.

සරසවියෙන් පිට වූ පසු මුනිදාස මට වරක් හෝ දෙවරක් මුණගැසුණේ නාලන්දා පිරිවෙණේදී ය. ඒත් අහම්බෙනි. ඔහු නිතර පුඤ්ඤරතන නායක හාමුදුරුවන් බැහැ දකින්නට එහි යන්නට පුරුදුව සිටියේය. දේශපාලනය කෙරෙහි ද සෑහෙන උනන්දුවක් දැක්වූ නායක හාමුදුරුවන්ගේ ආශිර්වාදය සහ සහයෝගය ඔහුට ලැබුණේ ය. හොරණ ආසනය ශ්‍රී ලංකා නිදහස් පක්සයට දිනා ගත හුකි වුවද, උඩුගහපත්තු ගම්කාර්ය සභාව තුළ එඩ්මන්ඩ් අමරසේකර මහතාගේ බලය නොපිහිරී පැවැත්තේ ය. පාර්ලිමේන්තුවට යන ගමන ගැන උනන්දුවක් නොදැක්වුව ද ගම්සභා ප්‍රදේශයේ බලය අතට ගන්නට මුනිදාස කල්පනා කලේ එජාප බලවතා ගේ කබල බිඳීමේ අදහසින් විය යුතුය. ගම් කාර්යසභාවේ බලය අල්ලන්නට මුනිදාස අදහස් කරන බව අණිත් කොණින් අසන්නට ලැබුණ ද ගමේ හෝ ගම්සභාවේ බල අරගලය ගැම මගේ එතරම් උනන්දුවක් කිසි දිනක නොවී ය. පනස් හයේ මැතිවරණය දා ද ගමට අවුත් ඡන්දය දැමූ මම ආ පයින් ම ආපසු ගියෙමි.

මා ආනන්දයේ ශිෂ්‍ය නිවාසයේ සිටියදී එක් සැන්දෑවක මා සොයා ගෙන ආ මුරකරුවෙක් මා මුණ ගැහෙන්නට හාමුදුරු නමක් පැමිණ ගේට්ටුව ළඟ සිටින බව දැන්වී ය. එය සාමාන්‍ය සිද්ධියක් නොවූයෙන් මම හනි හනික ගේට්ටුව දෙසට ගියෙමි. ගේට්ටුවෙන් ඇතුළිට පිවිසි කාරයක් තුළ ඉදිරි අසුනේ වාඩි වී සිටියේ පුඤ්ඤරතන නායක හාමුදුරුවෝ ය. මම ළඟට ගියෙමි. රියැදුරු අසුනේ සිටි රියැදුරා විශේෂ පුද්ගලයෙකි. මුනිදාසගේ මස්සිනා ඩී.එෆ්. වැලිකල ය. හුමුදුරුවන් පැමිණ සිටියේ වැලිතලගේ රියෙන් ය. බැරෑරුම් බැල්මක් මුහුණට නඟාගත් නායක හාමුදුරුවෝ තමාගේ ගමනේ අරමුණ කෙළින්ම ප්‍රකාශ කළහ.

''අපි ඉන්නේ ප්‍රේමරත්නව ගම් සභා ඡන්දෙට ඉදිරිපත් කරන්නයි. මේ ආවෙ බෝල්ඩ්වින්ට කියල යන්නයි.''

ගහෙන් ගෙඩියක් එන්නා වාගේ දෙයක්. ප්‍රේමරත්න, ඒ කියන්නේ මගේ මල්ලි, දේශපාලනය ගැන උනන්ද්වක් දැක්වූ බවක් වත් මම නො දත්තෙමි. මා ඉදිරියේ වැඩ සිටින්නේ මුනිදාසගේ නියෝජිතයකු බව සිතා ගන්නට මොහොතක් ගත වූයේ නැත. ඔහුගේ මස්සිනා සිටීම එය තහවුරු කරන්නකි. අනෙක් අතර නායක හාමුදුරුවන් වැඩම කර ඇත්තේ හුදෙක් මෙම නිවේදනයකොට යන්නට නොවන බවත් මට පැහැදිලි ය. මා නොදැන තරඟ කරන්නට එකඟ වුවත් නියත වශයෙන් ඉදිරිපත් වන්නට මගේ අනුමැතිය මල්ලීට අවශ්‍ය බව මම දනිමි. මගේ සිත දස අතේ වේගයෙන් දුවන්නට වූයේ ඒ නිසා ය.

පොඩි අයියා (පොඩි හාමුදුරුවෝ) පන්සලේ සිටියා නම් තීරණය ගන්නේ ඔහු ය. මා සමසමාජයට එකතු වූ බව ඔහු දැන ගත්තේ තක්ෂිලාවේ සිට කලබල කරන කාලේ ය. ඒ අවදියේ වැල්ලම්පිටියේ පන්සලේ සිට තාත්තාට එවූ ලියුම්වල සමසමාජය ළො දුටුවේ 'ගොම' සමාජය කියාය. (පොඩි අයියා මටත් වඩා තද සමසමාජ කාරයෙකු වූයේ ජීවිතයේ අවසාන භාගයේ ය) හාමුදුරුවන්ගේ මේ දූත මෙහෙවර මා වෙත එන විට පොඩි අයියා ගිහි වෙස් ගෙන දරුමල්ලන් රකින්නෙකි. පවුලේ තීරණ කෙරෙහි පැවැති ඔහුගේ බලපෑම ද පිරිහී ගොසින් ය. අවසාන තීන්දුව මා විසින් ගත යුතු වූයේ එහෙයිනි. ක්ෂණික අතීතාවර්ජනයක යෙදුණු මගේ සිත හාමුදුරුවන් කරන්නට යන දේට කෙළින්ම හරස් විය. මම වචනයට නඟා කීවෙමි.

''මම ඒකට විරුද්දනේ, නායක හාමුදුරුවනේ''

මින් එහාට කතාව කාරකේම ඉඳන් කරන්නට බැරි බව නායක හාමුදුරුවන්ට වැටහුණෙන් උන්වහන්සේ රියෙන් බැස මා සමඟ ටික දුරක් ගමන් කළ සේක. දැන් මට මගේ ස්ථාවරය සහේතුක වූවක් බව උන්වහන්සේට ඒත්තු යන පරිදි පැහැදිලි කිරීමේ වාරය එළඹ ඇත.

මගේ සිත දිව ගියේ පවුලට මුහුණ පාන්නට වූ දරුණුම ආපදාව නොහොත් බලවත්ම වියෝගය වෙතය. මගෙන් පසු තක්ෂිලාවට යාමේ වාරය ලද මගේ පවුලේ අනෙක් සාමාජිකාව වූයේ චූටි නංගිය. බාප්පාගේ නිවසේ ඇති දැඩි වුවද, අප සියලු දෙනාගේ සෙනෙහස දිනා ගනිමින් කීකරු සුවිනීත දැරියක ලෙසින් අප සැමගේ හද පුබුදු කරමින් ළමා විය ඉක්මවමින් සිටියදී අසනීප වූ චූටි නංගීගේ අභාවය මීට දෙවසරකට පමණ උඩදී සිදු වූවකි. පුරුදු පරිදි වෙද බාප්පාගේ ප්‍රතිකාරවලින් පටන් ගෙන වෙදකමට බැරි වූ තැන අපි ඇය කොළඹ මහ රෝහලට ඇතුළු කළෙමු. ඇයගේ රෝගය සුව කරන්නට නොහැකි එකක් බව මුලින් ම මට කීවේ මගේ පාසැල් මිතුරු වෛද්‍ය ශිෂ්‍යකු වූඅ ගුණසිරි පල්ලෙවෙල ය. වාට්ටුව භාර වෛධ්‍යවරියගෙ න් ඇති තතු දැන ගත් ඔහු මට දුන් පළමු අවවාදය අම්මාට මේ තත්ත්වය හෙම්හිට අවබෝධ කළ යුතු බවය. ඔහුගේ ම උපදෙස් පරිදි එම වාට්ටුවේ වැඩ කළ තරුණ වෛද්‍යවරයකු මුණ ගැසෙන්නට ගියෙමි. මා ගියේ ඔහුගේ නවාතැනට ය. මා පුදුමයට පත් කරමින් මා සමඟ පැය භාගයක් පමණ සුහදව විස්තර කී ඔහු ද ගුණසිරි කී දේ ම සනාථ කළේ ය. ඉන් පසු නංගී